කයිට්ස් ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 11 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 10 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව කයිට්ස් ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කයිට්ස් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්විම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

(අ) වත්කම්, ආදායම් හා වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන්හි කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| වැඩියෙන් දැක්වීම | 01 | 1,186 | 01 | 106,000 | - | - |
| වර්ගීකරණ දෝෂ | - | - | 01 | 56,000 | - | - |
| අත්හැරීම් | - | - | - | - | 01 | 3,962,724 |

1.3.2 අක්‍රිය බැංකු ගිණුම්

තේවරාතම් මණ්ඩල සේවාවේ ආදායම් රැස් කිරීම සහ වියදම් කටයුතු මෙහෙයවීම සඳහා මහජන බැංකුවේ විවෘත කරන ලද අංක 726 දරන ජංගම ගිණුමෙහි 2002 වර්ෂයේ සිට ගනුදෙනු සිදුවී නොතිබුණු අතර එහි දැක්වුණු ශේෂය රු.165,201 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති විම

අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.88,178,965 ක් වු ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස නිරික්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවු වියදම් අතිරික්තය රු.2,641,627 ක් වු අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම් අතිරික්තය රු.11,383,489 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබු බැවින් අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර රු.6,805,200 ක වෙනසක් ද අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.5,785,002 ක වෙනසක් ද විගණනයේදි නිරීක්ෂණය විය.

(ආ) සංවර්ධන කටයුතු වල ආදායම ඉක්මවා වියදම් සිදුවන අවස්ථාවන්හිදි සභාව විසින් සංශෝධිත අයවැය ලේඛණයක් පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද, මහජන බැංකුවේ කයිට්ස් ශාඛාවේ ස්ථාවර තැන්පතු වල රු.1,200,000 ක මුදලක් තැන්පත් කර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

--------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟ |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 17 | - | - |
| බදු කුලි | 2,498 | 1,274 | - |
| බලපත්‍ර ගාස්තු | 476 | 279 | - |
| වෙනත් ආදායම් | 25,019 | 19,651 | 4,190 |
| | 28,010 | 21,204 | 4,190 |

2.3.2 උසාවි දඩ

--------------

2012 වර්ෂය සඳහා විවිධ ආඥාපනත් යටතේ පනවන ලද රු.1,052,175 ක් වූ උසාවි දඩ සහ දණ්ඩන අයකර ගැනීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

-------------------

(අ) 2010 සහ 2011 වර්ෂ සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ගෙන් අයවිය යුතු රු.1,683,880 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා රු.1,040,590 ක් වූ මුද්දර ගාස්තු උපලේඛණය ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලබාගෙන නොතිබුණු අතර එම මුදල ගිණුම් ගතකර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

---------------------------------

2.4.1 නිෂ්ක්‍රිය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------------------

සභාවට අයත් පහත සඳහන් විෂයයන් නිෂ්ක්‍රීයව තිබුණි.

| වත්කම් වර්ගය | වටිනාකම | නිෂ්ක්‍රීය කාලය |
|---|---|---|
| | රු. | |
| උතුරු පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අධිකාරිය විසින් පරිත්‍යාග කළ රෝද 2 ට්‍රැක්ටරය | 100,000 | 2002 සිට මේ දක්වා |
| උතුරු පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අධිකාරිය විසින් පරිත්‍යාග කළ රෝද 2 ට්‍රැක්ටරය | 150,000 | 2002 සිට මේ දක්වා |
| තේවරාතම් බෝට්ටුව | අගය කර නැත | 2008 සිට මේ දක්වා |

2.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ගේ විධිවිධානයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව. | | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| (i) II පරිච්ඡේදයේ 4 වගන්තිය | - | තක්සේරු බදු සහ සභාව විසින් අයකර නොතිබුණු බදු වලට අදාළව තක්සේරු ලේඛනයක් සභාව විසින් පවත්වා නොතිබුණි. |
| (ii) I පරිච්ඡේදයේ 97 වගන්තිය | - | අයවැය ලේඛනයේ සඳහන්ව ඇති ආකාරයට වවුචරයෙහි වැඩසටහන් වියදම් විෂයයන් සඳහන් කර නොතිබුණි. |
| (iii) V පරිච්ඡේදයේ 120 වගන්තිය | - | නියමිත දිනයට අත්තිකාරම් නිරවුල් කිරිමට අපොහොසත් වූවන්ට එරෙහිව ලේකම්වරයා කටයුතු කර නොතිබීම හේතුවෙන් අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.1,615,251 ක් ලෙස දක්වා තිබුණි. |
| (iv) III පරිච්ඡේදයේ 66 වගන්තිය | - | රු.271,978 ක් වූ හිඟමුදල් අයකර ගැනිමට ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>---------------------------------------------------<br>මු.රෙ. 271 | - | කල් ඉකුත් වූ තැන්පතු සහ නොගෙවූ වැටුප් රු.1,609,000 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ වෙනුවට එම ශේෂයන් දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | - | 2006-2012 කාලපරිච්ඡේදය තුල එකතු කළ රු.1,024,906 ක් වූ එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණු අතර විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි. |
| (ඈ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | - | 2012 වර්ෂයේදි අයකළ රු.54,218 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

---------------------------------------

භාවිතා නොකරන විෂයයන් වෙන්දේසි කිරීමේ රාජකාරි වෙනුවෙන් අංක පීටී/1/2009 සහ 2009 ජනවාරි 28 දිනැති උතුරු පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 11 පරිච්ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදි රු.2500 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙය 2011 වර්ෂයේදි ගර්හිත භාණ්ඩ විනාශ කිරීමට අදාළ රාජකාරි ලෙස සාවද්‍යා අයුරින් ගිණුම්ගත කර තිබුණි.

2.7 නිම නොකළ ව්‍යාපෘති

----------------------------

2012 අයවැය ලේඛනයෙහි ඇතුලත් වු රු.1,450,000 ක් වු ප්‍රාග්ධන වැඩ 02 ක් නිමකර නොතිබු බව නිරික්ෂණය විය. කෙසේ වුවද රු.1,200,000 ක් වු සභා අරමුදල් පොලී ඉපයිමේ අරමුණෙන් මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුමෙහි තැන්පත් කර තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(අ) ප්‍රජා මධ්‍යස්ථාන සහ වැසිකිලි සඳහා 2006-2010 කාලය තුල පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දෙන ලද රු.189,978 ක් වු පරිත්‍යාග අදාළ විශේෂිත කාර්යයන් සඳහා යොදවා නොගෙන විවිධ තැන්පතු ගිනුමෙහි රඳවා ගෙන තිබුණි.

(ආ) ජලාපවහන පද්ධති පිරිසිදු කිරිම සහ පානීය ජලය බෙදා හැරීම සඳහා 2002 වර්ෂයේදි දිස්ත්‍රික් ලේකම් විසින් දෙන ලද රු.250,000 ක් අදාළ විශේෂිත කාර්යයන් සඳහා යොදවා නොගෙන වෙනත් තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඇ) පසුගිය කාලපරිච්ඡේදයේදි මියගිය සහ තම තනතුරු අතහැර ගිය නිලධාරින්ට අදාළ වියදම් වශයෙන් සලකන ලද නොගෙවු වැටුප් රු.395,138 ක් ගෙවිමට හෝ ආදායමට මාරු කිරිමට හෝ කටයුතු කර නොතිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය

-----------------------------

ප්‍රාදේශිය සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

-----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ආදායම් එකතු කිරිම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) මාසික රැස්වීම් වාර්තා
(ඈ) ගිණුම්කරණය
(ඉ) මානව සම්පත්
(ඊ) පරිත්‍යාග
(උ) වාහන උපයෝජනය
(ඌ) විවිධ තැන්පතු
(එ) අයවැය පාලනය